# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009
2010 අගෝස්තු / සැප්තැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

මනෝ විද්‍යාව - PSYC -E3015

සමාජ චර්යා පිළිබඳ මනෝවිද්‍යාව

<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි        කාලය : පැය 03 යි

---

01. "සමාජ චර්යාව පිළිබඳ මනෝවිද්‍යාව විසින් චින්තනය, හැඟීම් සහ ක්‍රියාවන් (thought, feelings and actions) පුද්ගලයා කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් බලපාන්නේ කෙසේදැයි අවධාරණය කරයි." සාකච්ඡා කරන්න.

02. සමාජ ආකල්පයන්ගේ ස්වභාවය පැහැදිලි කරමින් ඒවා පුද්ගල චර්යාව කෙරෙහි බලපාන ආකාරය පරීක්ෂා කරන්න.

03. සමාජ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය (Social interaction) යනු කුමක්ද? එය පුද්ගල චර්යාව කෙරෙහි බලපාන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

04. පුද්ගලාන්තර ආකර්ෂණය (interpersonal attraction) යනු කුමක්දැයි හඳුන්වා අන්‍යයන් පිළිබඳ ධනාත්මක හැඟීම් පුබුදුවන ප්‍රධාන සාධක මොනවාදැයි පැහැදිලි කරන්න.

05. අන්‍යයන්ගේ චරිත ලක්ෂණ පිළිබඳව අප විනිශ්චයන් සිදු කරන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

06. "සමාජ බලපෑම මගින් පුද්ගලයෙකුගේ හෝ කිසියම් කණ්ඩායමක ක්‍රියාකාරිත්වය අන්‍යයන්ගේ චර්යාව කෙරෙහි බලපාන්නේ කෙසේදැයි අවධාරණය කරනු ලබයි." සාකච්ඡා කරන්න.

07. අන්‍යයන්ට උදව්කිරීමේ දී අදාළ වන මූලික පියවරයන් සඳහන් කොට විමසන්න.

08. පහත දැක්වෙන මාතෘකා **<u>හතරක්</u>** පිළිබඳව සටහන් ලියන්න.

i. ආකල්ප පිළිබඳ ABC ආකෘතිය (ABC model of attitudes)

ii. චර්යාව පිළිබඳ සංවිහිතික (ස්වභාවික) හේතුව (Dispositional cause of behavior)

iii. ප්‍රභාවලය (Halo – effect)

iv. අගතිගාමීත්වය (Prejudice)

v. ප්‍රචණ්ඩත්වය (Aggression)

****************************